මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: BD/NSLE/103/DMD/09/2025
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025.11.28

**අයවැය චක්‍රලේඛ අංක: 05/2025**

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත

**හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් වී ඇති ජනතාවට සහන සැලසීම**

උදා වී ඇති හදිසි තත්ත්වය යටතේ පීඩාවට පත් වී ඇති ජනතාවට කඩිනමින් සහන සැලසීමට අදාලව භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ අත්පොත - 2024 හි සඳහන් 3.1.8 අනුව කටයුතු කරන මෙන් දන්වා සිටිමි.

02. ඒ අනුව, ප්‍රාදේශීය ලේකම්වරයෙකුට ඉහත මාර්ගෝපදේශ සංග්‍රහයේ සහ අත්පොතෙහි 2.9 යටතේ දක්වා ඇති සීමාව වන රු. මිලියන 50 ක් දක්වා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු කිසිදු බාධාවකින් තොරව කඩිනමින් සිදුකළ හැකි බව ප්‍රසම්පාදන කොමිෂම විසින් මා වෙත දන්වන ලදී.

03. ඉහත 02 ඡේදයේ දක්වා ඇති පරිදි කටයුතු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්ට රු. මිලියන 50 ක් දක්වා වැය කිරීමට හැකිවන පරිදි මූල්‍ය බලතල ලබා දීමට දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් කඩිනමින් කටයුතු කළ යුතුය.

04. එයට අමතරව, ආපදාවට පත් වී ඇති ජනතාවට සහන සැලසීමට තවදුරටත් දැරිය යුතු වියදම් වේ නම්, දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ඒ පිළිබඳ අවශ්‍ය බැඳීම් ඇති කර ගැනීමටත්, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ගැලපීම් සිදු කර දීම සඳහා නොපමාව ආරක්ෂක අමාත්‍යාංශයේ, ආපදා කළමනාකරණ අංශය මගින් මා වෙත දැනුම් දීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

**ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම**
**භාණ්ඩාගාරයේ ලේකම්**

පිටපත් :
1. ජනාධිපති ලේකම්
2. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
3. අග්‍රාමාත්‍ය ලේකම්
4. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
5. සභාපති, ප්‍රසම්පාදන කොමිෂන් සභාව
6. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
7. විගණකාධිපති

(මේ පිළිබඳව අවශ්‍ය පැහැදිලි කර ගැනීම් වේනම්, දුරකථන අංක 071-5348638 මගින් මහලේකම්, ප්‍රසම්පාදන කොමිෂන් සභාව සහ දුරකථන අංක 071-8174116/071-6421698 මගින් අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති), ප්‍රසම්පාදන කොමිෂන් සභාව විමසිය හැකිවේ.)